## පොත් පත් පුවත්

**කිරි ගෙදර**

ජයකොඩි සෙනෙවිරත්න

ප්‍රකාශනය-දයාවංශ ජයකොඩි සහ සමාගම

මිල රුපියල් 400/-

# ගෘහස්ථ කිරි ව්‍යාපාරයේ බිඳවැටීම මගේ නවකතාවට පාදක වුණා

## - ජයකොඩි සෙනෙවිරත්න

ශ්‍රීලාල් සෙනෙවිරත්න

ප්‍රවීණ ලේඛක ජයකොඩි සෙනෙවිරත්නගේ අලුත්ම නවකතාව 'කිරි ගෙදර' නමින් දයාවංශ ජයකොඩි සහ සමාගමේ ප්‍රකාශනයක් ලෙස පසුගියදා ප්‍රකාශයට පත් කෙරිණ. දශක කීපයකට පෙර පුවත්පත්වල කොටස් වශයෙන් පළවෙන නවකතා රචනයේ ප්‍රමුඛ නාමයක් හිමිකරගෙන සිටි ජයකොඩි සෙනෙවිරත්න මේ වන විට ලියා ප්‍රකාශයට පත්කර ඇති නවකතා සංඛ්‍යාව 61කි. මුල මැද අග පිළිවෙළින් ලියැවෙන සරළ වින්‍යාසයක් නවකතාකරණයේදී අනුගමනය කරන ඔහු විසින් රචනා කරන ලද නවකතා සියල්ලම පාහේ පාඨක ප්‍රසාදයට ලක්විය. 1984 වසරේ රාජ්‍ය සාහිත්‍ය සම්මානය හිමි වූ 'කුමාරිහාමි' නවකතාව මෙන්ම මහාචාර්ය සුනිල් ආරියරත්න විසින් සිනමාවට නැංවූ 'මිහිදුම් සළු' නවකතාවද ජයකොඩි සෙනෙවිරත්නගේ නිර්මාණයන්ය.

'ආදර ගඟ ගලන දෑස', 'සුදු හාමිනේ', 'නොමැරෙන මිනිස්සු', 'කස්තිරම', 'නිකිණි වැස්ස', 'ඇස් බැඳුම', 'පාලොස් පැය' ඔහු අතින් ලියැවුණ සෙසු නවකතා අතරින් කිහිපයකි. 'ආඬි හත්දෙනා' සහ 'ලෝකෙට ලොක්කා' නමින් ළමුන් සඳහා වන පොත් දෙකක්ද ජයකොඩි සෙනෙවිරත්න විසින් ලියා තිබේ. කිරිඳිවැල, කොළඹ පාරේ, නුගහේනවත්තේ, අංක 9 දරණ ලිපිනයේ පදිංචි ලේඛක ජයකොඩි සෙනෙවිරත්නගේ දුරකථන අංකය 033 2267540 වේ.

**'කිරි ගෙදර' නවකතාව ලියැවෙන්නේ මොන වගේ පසුබිමකද?**

1934 සිට විසිදෑඅවුරුද්දක ලංකාවේ දේශපාලනික, සංස්කෘතික, සමාජීය සහ ආර්ථික විකාශය අළලා මීට අවුරුදු කීපයකට කලින් මම සිව් ඈඳුතු නවකතාවක් ලිව්වා. මේ නවකතා හතරම මම හිතුවටත් වැඩිය පාඨක අවධානයට ලක්වුණා. ඒ නිසා එවැනි තවත් නවකතාවක් ලිවීම සුදුසුයි කියලා මට හිතුණා. මම විශ්වාස කරන දෙයක් තමයි යම් නවකතාවකට පසුබිම් වන කාල වකවානුවේ රටේ පැවැති සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික මුහුණුවර ගැන අදහසක් පාඨකයාට කතාව කියවන විට ලැබෙන විදිහටයි නවකතාවක් ලියැවෙන්න ඕනේ කියන එක. ඒ අනුව පනහ දශකයේ ග්‍රාමීය මධ්‍යම පාන්තික පවුලක් මුල්කරගනිමින් මම 'කිරි ගෙදර' රචනා කළා.

**මෙහි එන චරිත සහ සිදුවීම් කාල්පනිකද?**

කතාවේ සීයට හැත්තෑපහක් විතරම මගේ අත්දැකීම් මුල්කරගෙන ගොඩනැඟුන ඒවා. දශක කීපයකට ඉස්සෙල්ලා අපේ රටේ කිරි පට්ටි ව්‍යාපාරය බොහොම සරුවට තිබුණා. කාලයක් ගතවෙනකොට ඇතිවුණ දේශපාලනික, ආර්ථික හේතු නිසා මේ ව්‍යාපාරය බිඳවැටුණා. ඒ කාලේ මම ලබපු අත්දැකීම් මුල්කරගෙන, ඇතැම් තැනක සත්‍ය චරිත සහ සිදුවීම් යොදාගෙන තියෙනවා. කිරි පට්ටි ව්‍යාපාරයේ නිරතව සිටි මධ්‍යම පාන්තික පවුලක් මුල්කරගෙන තමයි නවකතාව විකාශනය වන්නේ

**වර්තමානයේ ලියැවෙන, සාහිත්‍යමය අගැයීම්වලට ලක්වන නවකතාවල දකින්න ලැබෙන කතා වින්‍යාශයේ විවිධත්වය ඔබේ නවකතාවල ප්‍රකට නැත්තේ ඇයි?**

මම ලේඛන කලාවට පිවිසෙන අවදියේ මේ රටේ ඉතාමත් ජනප්‍රියවෙලා තිබුණේ සරල වින්‍යාසයක් සහිත යථාර්ථවාදී නවකතා කලාව. ඒ කාලේ හිටිය මාර්ටින් වික්‍රමසිංහ, ගුණදාස අමරසේකර, කේ. ජයතිලක ආදී ලේඛකයන් සියලුදෙනාම නිර්මාණ කළේ ඒ තුළ. හැත්තෑව දශකය අවසන් භාගයේ සිට බටහිර සාහිත්‍ය විචාර ක්‍රමයට අනුගතවන අපේ ලේඛකයොත් කතාව කීමට එක එක මෝස්තර අනුගමනය කරන්නට පෙළඹුණා. නමුත් මම දකින දෙයක් තමයි සාහිත්‍ය නිර්මාණයක් කියවන මුල්වතාවෙම රසයක් ජනිතවන ආකාරයට සරළව ලියූ තරමට තමයි සාහිත්‍ය රසවින්දනය පොදු ජනයා අතරට ගෙනයාමට හැකිවෙන්නේ. ඒ නිසා මම වින්‍යාසය වෙනස් කිරීමට උනන්දුවන්නේ නෑ.

**ඒක ඔබට අවාසි සහගත නැත්ද? විශේෂයෙන්ම සම්මාන වැනි අගැයීම්වලදී?**

සම්මාන සම්බන්ධයෙන් නම් මම බොහොම උදාසීනයි. මම විචාරකයන් මගින් හෝ විශ්වවිද්‍යාල සාහිත්‍ය කුල, කල්ලි මගින් මතුවෙච්ච ලේඛකයෙක් නෙවෙයි. මේ වෙනකොට මම නවකතා හැටක් ලියලා තියනවා. ඒ සියල්ලම පාඨකයෝ පිළිඅරගෙන තියනවා. ඒ නිසා තමයි හැට එක්වෙනි නවකතාවක් ලියැවෙන්නේ. ඒ මහජන සම්මානය මට කොයි සම්මානයටත් වඩා වටිනවා. මම සම්මාන පසුපස හඹා යන කෑදරකමක් තියන මිනිහෙක් නෙවෙයි.




**ඔබ සාහිත්‍ය සම්මාන ප්‍රතික්ශේප කරනවාද?**

මේ සාහිත්‍ය කෘති අන්තිමට සම්මාන සඳහා තේරෙන්නේ දෙන්නෙකුගේ හෝ තුන්දෙනෙකුගේ රුචිකත්වය උඩ. ලෝකයේ කොතනක වුණත් ඒක එහෙමයි. ඒකයි මම කියන්නේ පාඨක සම්මානය කොයි සම්මානයටත් වඩා වටිනවා කියලා. නමුත් මම සම්මාන ප්‍රතික්ශේප කරන්නෙත් නෑ. 85දි මගේ 'කුමාරිහාමි' නවකතාවට රාජ්‍ය සාහිත්‍ය උළෙළේ හොඳම නවකතාවට හිමි සම්මානය ලැබුණා. තවත් අවස්ථා කීපයකදී විවිධ සංවිධානවලින් අගයකිරීම් කීපයකුත් සිදුවෙලා තියනවා. එහෙම වෙනවෙලාවට මම ඒවා පිළිගන්නවා.

**මෙවර ගොඩගේ සාහිත්‍ය සම්මාන උළෙලේ දී හොදම නවකතාවට හිමි සම්මානය ප්‍රදානය කෙරුණේ නෑ. ඒ සඳහා සුදුසු නවකතාවක් නැති බවයි විනිශ්වය මණ්ඩලයේ මතය ලෙස ප්‍රකාශයට පත්වුණේ?**

මම දන්නේ නෑ ගොඩගේ සම්මාන ප්‍රධානයට කෘති තෝරාගන්නා නිර්ණායක මොනවද කියලා. ඒ අයගේ නිර්ණායකවලට ගැලපෙන කෘතියක් නොතිබ්බනම් සම්මාන නොදී සිටීමේ වරදක් නෑ. හැබැයි මම දන්න විදිහට ඒකේ මුල් වටයේ සලකා බැලුව නවකතාවලින් කෘති කීපයක්ම අවසන් වටයට තෝරාගෙන තියනවා. එහෙම අවසන් වටයට කෘති තෝරාගත්ත නම් ඒ අතරින් වඩා සුදුසු කෘතියක් තෝරාගෙන ඒකට සම්මානය දෙන එක තමයි වෙන්න ඕනේ කියන එකයි මගේ අදහස.

**ඔබගේ ඉදිරි බලාපොරොත්තු මොනවද?**

දීර්ඝ අනාගතයක් ගැන මා තුළ බලාපොරොත්තු හෝ සැළසුම් නෑ. මොකද මනුෂ්‍යයෙකුට ජීවත්වෙන්න පුළුවන් කාලසීමාවක් තියනවානේ. ඒ කාලය තුළ තවත් හොඳ නවකතා කීපයක් කරන්න හැකිවේයැයි මගේ බලාපොරොත්තුවක් තියනවා.

(මේ සාකච්ඡාවේ හඬ පටයට www.sannasa.net හෝ www.thisara.com හිදී "තිරස" ගුවන් විදුලිය ඔස්සේ සවන් දෙන්න)




